**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email - sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය** / Editors
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක** /Asst Editor
**ක්‍රීඩා සංස්කාරක** / Sports Editor
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා** / Graphics
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ**/ Photography
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම්** / Advrertising
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත



# යහපාලනයේ දෑවුරුද්දක ආ ගිය කතා



**ගාමිණී වියන්ගොඩ**

දෑවුරුද්දක් යනු මුළු යහපාලනික පාලන වාරයෙන් අඩකට ආසන්න කාලයකි. හිටපු පාලන තන්ත්‍රය තුළ ස්ථාපිත කොට තිබූ අධිකාරීවාදී සහ අත්තනෝමතික තන්ත්‍රය මේ කාලය තුළ පෙරලා දමා තිබේ. ගත වූ කාලයේ අත්කරගෙන තිබෙන විශිෂ්ඨතම ජයග්‍රහණය එයයි.

ජනාධිපතිවරයාගේ බලතල අවම කර ගැනීමේ සිට විපක්ෂයේ දේශපාලනයට ඉතා කෙටි කාලයක් තුළ පෙර නොවූ විරූ ජවයක් ලැබී තිබීම හෝ සපයා තිබීම එහිදී කැපී පෙනේ. එසේම, පැවති පාලන තන්ත්‍රය යටතේ සිදුවූ මහ පරිමාණ දූෂණ සහ වංචා, එයාකාරයෙන් මේ පාලනය යටතේ කරගෙන යාමේ ඉඩකඩ මේ කාලය තුළ තදින් හකුළුවා තිබේ. ඊට හේතු වී ඇත්තේ, 2015 ජනවාරියෙන් පසු නිර්මාණය කරගත් විවේචනාත්මක පරිසරයයි.

එම පරිසරය තුළ, පාලකයන් කරන කියන දේවල් දෙස (අහක) බලාගෙන සිටීමට නොව, ඒවා ගැන ප්‍රසිද්ධියේ කටයුතු කිරීමට සහ ඒවා විවේචනය කිරීමට ඇති මහජන අවකාශය අතිශයින් ප්‍රසාරණය වී තිබේ. ඒ කෙතෙක්ද යත්, කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු පවා තමන්ගේ ආණ්ඩුවේම කල්ක්‍රියා අද ප්‍රසිද්ධියේ විවේචනය කරති. වැඩියත්ම එසේ කරන්නේ, වර්තමාන කැබිනට්ටුවේ සිටින, එදා මහින්ද රාජපක්ෂගේ කැබිනට්ටුවේ සිටි, අයවළුන් වීම විශේෂිතයි. ඉස්සර අන්ධයෝ දැන් දකිති. ඉස්සර ගොළුවෝ දැන් බනිති. ඉස්සර බිහිරෝ දැන් සවන්දෙති.

සාමාන්‍ය ජනතාවගේ පැත්තෙන් ගත්තත්, ආණ්ඩු විරෝධී වීම, සුදුවෑන් එකකින් පැහැරගෙන යනු ලැබීමට තරම් පාප කර්මයක් වීම දැන් සපුරා අවසන්ව තිබේ. ඕනෑම දෙයකට පාරට බසින සටන්කාමී ජනතාවක් අද සිටිත්. වෘත්තිය සමිති ක්‍රියාකාරීත්වයත් අද වන විට රැඩිකල් මට්ටමකට පත්ව තිබේ. එය මීට අවුරුදු දෙකකට කලින් දකින්ට නොලැබුණු තත්වයකි. ස්වකීය වෘත්තීය අයිතීන් වෙනුවෙන් පමණක් නොව, අන්‍යයන්ගේ ජීවිත අයිතියත් තමන්ට දෙන්නැයි ඉල්ලා වැඩ වරන පෞද්ගලික බස්රථ හමුදාවක් පවා අද අපට සිටිති. ඉතිං, මොන අඩුපාඩුකම් යටතේ වුවත්, 2015 ජනවාරි නිදහස අද වැඩියෙන්ම භුක්ති විඳින්නෝ, 2015 ජනවාරි ජයග්‍රහණයට හතුරුව සිටි පිරිස් වීම මනස්කාන්තය. එහි වරදක් නැත.

එසේ තිබියදීත්, ගත වූ දෑවුරුද්ද තුළ මහ පරිමාණ දූෂණ සහ වංචා ගැන ඉඳහිට වාර්තා වුණි. ඉන් ප්‍රධාන තැනක් ගත්තේ මහ බැංකු බැඳුම්කර වංචාවයි. මේ වන විට ඒ පිළිබඳ ලිපිගොනුව නීතිපතිවරයා වෙත යැවෙන බව කියැවේ. කෙසේ වෙතත්, නීතිපතිවරයා වෙත ලිපිගොනුවක් ගිය පමණින්, වැරදිකරුවන්ට එරෙහිව අධිකරණයක් ඉදිරියේ චෝදනා ගොනු කිරීමකට එහා දෙයක් සිදුවන බවට ජීවමාන සාක්ෂියකට ඉන්නේ දුමින්ද සිල්වා පමණි. එය, පැවති රාජ්‍ය තන්ත්‍රයේ සෘජු සහභාගීත්වයකින් තොරව කරන ලද ඝාතනයක් නිසා, එකී නඩුව සාර්ථකව අවසන් කිරීම,

4 වන පිටට




